සවියෙන් පෙරට
e ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

7 ශ්‍රේණිය
සිංහල භාෂාව හා සාහිත්‍යය
පළමු වාරය
06 පාඩම

# මේ කාගේ දෝ කමතා

බප/හො/බණ්ඩාරගම
මධ්‍ය මහා විද්‍යාලය

## ජන කවිය යනු,

ජනතාව අතරේම ඇති වී ජනතාව අතරේම ආරක්ෂා වී පැවත එන කවි ජන කවි නමින් හැඳින්වේ.

# ජන කවියේ සුවිශේෂී ලක්ෂණ,

* නිශ්චිත රචකයෙකු නොමැති වීම.

*ගැමි වදන් හා කතා ව්‍යවහාරය  බහුලව යොදා ගැනීම .

*එකම ජන කවිය හෝ කවි සුළු සුළු වෙනස්කම් සහිතව හෝ රහිතව විශාල ප්‍රදේශයක පැතිර පැවතී.

* දීර්ඝ කාලයක් මුළුල්ලේ ජනශ්‍රැතියක් ලෙස පැවතීම.

*විවිධ වූ වෘත්තීන් ආශ්‍රිත ව ජන කවි බිහි වී තිබීම.

*සිත් ගන්නා සුළු අලුත් උපමා රූපක භාවිතය.

* අව්‍යාජ බවින් යුක්ත වීම හා සරලත්වය.

# ජන කවි වර්ග

බමර කවි
පතල් කවි
පාරු කවි
පැල් කවි
කමත් කවි
දරු නැලවිලි කවි
මේවර කවි
කුරක්කන් කවි
ඔන්චිලි වාරම් කවි

# කමත් කවි

ශ්‍රී ලාංකික ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකර්මාන්තයේ නිරතවීමේ දී ගොයම් කපා කොළ මැඩවීමේ දී ගොවියෝ මෙබදු කවි ගායනය කරති.

ගොයම් කෙතටත් නෙළා ගත් අස්වැන්නටත් ඔවුන් දැක්වූයේ ඉමහත් ගෞරවයකි.

මහත් වෙහෙස ගෙන දෙන ගොයම් මැඩීමේ කාර්‍යයේ විනෝදයෙන් නියැලීමට කමත් කවි උපකාරී වේ.

කොළ මැඩීමේ යෙදෙන ගොනුන්ට දයාවෙන් අමතමින් සාම්ප්‍රදායික විශ්වාසවලට ගරු කරමින්ගොවියා සිය කාර්යය ඉටු කර ගන්නා ආකාරය මෙම කවිවලින් පිළිබිඹු වේ.

මිනිසුන්ට පමණක් නො ව දෙවියන් සේ ඇදහූ ස්වභාව ධර්මයට ද කොළ මැඩීමට දායක වන ගවයන්ට ද එම කවිවලින් කමතට ඇරයුම් කෙරෙයි.


සා/පෙළ - සිංහල භාෂාව හා සාහිත්‍යය

මේ කාගේ මේ කමතා
ඉරු දෙවියන්ගේ කමතා
ඉරු දෙවියෝ බිම් බදිතා
බිම් බැදි තැන කොළ බදිතා

***කමත - ගොයම් පාගන ස්ථානය**
***කොළ බදිතා- කමත් බිමේ මැද කොළ වර්ග තැම්පත් කිරීම**

මේ කාගේ දෝ කමතා
සඳ දෙවියන්ගේ කමතා
සඳ දෙවියෝ වැඩි කමතා
සඳ දෙවියන් බැත දෙවතා

**බැත- වී**

මේ කාගේ මේ කමතා
සැම දෙවියන්ගේ කමතා
සැම දෙවියෝ බිම් බදිතා
බිම් බැදි තැන කොළ බදිතා

**බිම් බදිතා - කොළ මැඩීම සඳහා බිම් සැකසීම**

මේ කොතනින් ගෙනා ගොනා
දෙව්න්දරින් ගෙනා ගොනා
ඒ මොනවට ගෙනා ගොනා
කොළ මඩනට ගෙනා ගොනා

**කොළ මැඩීම - ගොයම් පෑගීම**

කැලිය කොළ බැන්ද මටා
මදු කොළ බැන්දේ කුමටා
ඒ මට කළ හොඳ කමටා
කොළ මැඩවා දෙන් සොඳටා

*** කැලිය කොළ- පඳුරු වශයෙන් වැවෙන කිරි සහිත පැළෑටියකි.**
***මදු කොළ -හරකුන් කෑමට ප්‍රිය කරන ගිරිතිල්ල කුලයේ වැල් විශේෂයක්.**

ගලක් පළා ගලක් දුටිමි
එගල පළා රිදී දුටිමි
පැන් බොන්නට ළිඳක් දුටිමි
බැත උඩ සිට මුහුද දුටිමි

අටු කොටුවල තියෙන බැතා
ඉහළ පහළ තියෙන බැතා
ලබු ගෙඩිවල තියෙන බැතා
ගෙන පුරවා මේ කමතා

බුදුන් වඩින වේලාවයි
කිරි උතුරන වේලාවයි
කොළ මඩවන වේලාවයි
කමත පිරෙන වේලාවයි

ස්තූතියි !